# ජාතික රාජ්‍ය සභාවේ 1973
# අංක 25 දරණ ක්‍රීඩා පනත

( සහතිකය සටහන් කලේ 1973 ජූලි මස 09 වන දින )

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජූලි මස 27 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී)

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 1/72.

ජාතික ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු සහ ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව පිහිටුවීම සඳහා ද ක්‍රීඩා අරමුදලක් ඇති කිරීම සඳහා ද ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම සඳහා සහ ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. මේ පනතෙහි දක්වා ඇති කාර්යයන් සඳහා මේ පනතෙහි මතු දක්වෙන විධිවිධානවලට අනුකූල ව—

(අ) ජාතික ක්‍රීඩා සභාවක් ;

(ආ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු ගණනක් ;

(ඇ) ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව ;

(ඈ) ජාතික ක්‍රීඩා අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ; සහ

(ඉ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ක්‍රීඩා ශිල්පායතන ගණනක්

පිහිටුවනු ලැබිය හැකි ය.

ජාතික ක්‍රීඩා සභාවක් ආදිය පිහිටුවීම.

3. (1) ක්‍රීඩා අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතු ය. ක්‍රීඩා අධ්‍යක්ෂවරයා විශයෙන් ඔහු වෙත මෙම පනත යටතේ අමාත්‍ය වරයා විසින් පවරනු ලබන යුතුකම් හා කාර්යයන් යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

(2) එක් සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරයකු හෝ ඊට වැඩි ගණනක් සහ මෙම පනතේ කාර්යයන් සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති යටතේ පත් කරනු ලබන සියලු නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මෙම පනත යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධ ව කිසිදු නඩුවක් නොවිය යුතු ය.

ක්‍රීඩා අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් පත් කිරීම.

කේ 21825—10807 (73/7)

(5) මේ වගන්තිය යටතේ පත් කරන ලද සියලු නිලධරයන් විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ තම යුතුකම් හා කාර්යයන් ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධානවලට අනුකූල ව ක්‍රියා කළ යුතු ය.

## I වන කොටස

### ජාතික ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු හා ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුවක් පිහිටුවීම

ජාතික ක්‍රීඩා සභාව පිහිටුවීම.

4. (1) ශ්‍රී ලංකාවේ ක්‍රීඩා දියුණු කිරීම, සංවර්ධනය කිරීම සහ පාලනය කිරීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා, මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන සහ "ජාතික ක්‍රීඩා සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඒ සභාව—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකුගෙන් සහ වෙනත් සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් ;

(ආ) ක්‍රීඩා අධ්‍යක්ෂවරයාගෙන් ; සහ

(ඇ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ලේකම්වරයකුගෙන් සමන්විත විය යුතු ය.

(3) සභාවට පත් කරනු ලැබූ සාමාජිකයකු තමා එහි සාමාජිකත්වය දරන තාක් කල් ශ්‍රී ලංකාවේ යම් ජාතික ක්‍රීඩා සංගමයක හෝ වෙනත් ක්‍රීඩා මණ්ඩලයක හෝ සංවිධානයක ධුර දැරීම නතර කළ යුතු ය.

සභාවේ ක්‍රියාකාරිත්වය සහ යුතුකම්.

5. සභාවේ ක්‍රියාකාරිත්වය හා යුතුකම් සහ සභාවේ රැස්වීම් සඳහා ගණපූරණය මේම පනතේ විධිවිධානවලට යටත් ව නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

රීති.

6. සභාවේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා සභාව විසින් රීති සෑදිය හැකි ය.

සභාවේ සාමාජිකයන්ගේ ධුරය හිස්වීම, ඔවුන් ඉවත් කිරීම ආදිය.

7. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති, හෝ ලේකම් හෝ සාමාජිකයන් මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් වුවහොත් මිස, තුන් අවුරුදු කාල සීමාවක් ධුර දැරිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති, ලේකම් හෝ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍ය වෝචිත බව අමාත්‍යවරයා සලකනහොත් හේතු නොදක්වා ඔහු විසින් එසේ කළ හැකි අතර ඒ ඉවත් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් සභාපතිගේ, ලේකම්ගේ හෝ සාමාජිකයකුගේ ධුරය හිස් වූ විට එසේ හිස් වූ ධුරය දැරූ තැනැත්තා වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තකු හිස් වූ ධුරය දැරූ තැනැත්තාගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

8. යම් තැනැත්තකු— නුසුදුසුකම්.

(අ) කිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටිතහොත් ; හෝ

(ආ) කිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටිතහොත් ; හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනීමෙහි, කොටස් එක්කර සෑදීමෙහි, විකිණීමෙහි හෝ නිෂ්පාදනය කිරීමෙහි ලා කෙළින් ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් දරතහොත් ; හෝ

(ඈ) අමාත්‍යවරයාගේ මතය අනුව චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයක දී වරදකරු කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා සභාවේ සේවය කිරීමට නුසුදුසු විය යුතු ය.

9. කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය. නැවත පත් කරනු ලැබීමට සාමාජිකයකු සුදුසු බව.

10. අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයකු අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා ඔහුගේ ධුරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් වුවහොත් සාමාජිකයකු වශයෙන් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් අන් කිසි තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. වැඩ බලන සාමාජිකයන් පත් කිරීම.

11. (1) ඒ ඒ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නගාසිටුවීමට, සංවර්ධනය කිරීමට සහ පාලනය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා "දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක්" ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඔහු විසින් පිහිටුවනු ලැබිය හැකි ය. දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු පිහිටුවීම.

(2) පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා පිහිටුවනු ලබන සෑම දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් ම අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකුගෙන්, ලේකම්වරයකුගෙන් සහ දහතුන් දෙනකුට වැඩි නොවන තවත් සාමාජික සංඛ්‍යාවකගෙන් සමන්විත විය යුතු ය.

**දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල ක්‍රියාකාරිත්වය සහ යුතුකම්.**

12. මේ පනතේ විධිවිධානවලට යටත් ව දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල ක්‍රියාකාරිත්වය හා යුතුකම් සහ ඒ කමිටුවල රැස්වීම්වල ගණපූරණය නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

**දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල රීති.**

13. සෑම දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් විසින් ඒ කමිටුවේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා රීති සෑදිය හැකි ය.

**සාමාජිකයන්ගේ ධුරය හිස් වීම ආදිය.**

14. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක සාමාජිකයන්, මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් වුවහොත් මිස, තුන් අවුරුදු කාල සීමාවක් ධුර දැරිය යුතු ය.

(2) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවකට අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යාවෝචිත බව අමාත්‍යවරයා සලකනහොත් හේතු නොදක්වා ඔහු විසින් එසේ කළ හැකි අතර ඒ ඉවත් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් වන යම් සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තකු එසේ හිස් වූ ධුරය දැරූ සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

**සාමාජිකයන් නැවත පත් කිරීම.**

15. කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

**වැඩ බලන සාමාජිකයන්.**

16. අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා තම ධුරයේ යුතුකම් ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලික ව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් සාමාජිකයකු වශයෙන් වැඩ බැලීමට අන් කිසි තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

**දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක සාමාජිකයන් වශයෙන් සේවය කිරීම සඳහා නුසුදුසුකම්.**

17. යම් තැනැත්තකු—

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටිනහොත් ; හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටිනහොත් ; හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනීමෙහි, කොටස් එක්කර සෑදීමෙහි, විකිණීමෙහි හෝ නිෂ්පාදනය කිරීමෙහි ලා කෙළින් ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් දරනහොත් ; හෝ

(ඈ) අමාත්‍යවරයාගේ මතය අනුව චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයක දී වරදකරු කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා යම් දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක සේවය කිරීමට නුසුදුසු විය යුතු ය.

ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව පිහිටුවීම.

18. (1) "ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) ඒ කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) ශ්‍රී ලංකාවේ අන්තර් ජාතික ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් කිසිවකු වේනොත් එකී සාමාජිකයෝ; ඔවුන් (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබුවහොත් මිස නිල බලයෙන් පත් වන, ඡන්දය අහිමි සාමාජිකයන් විය යුතු ය; තව ද

(ආ) මේ පනතෙහි මින් මතු එන විධිවිධානවලට අනුකූල ව ලියාපදිංචි කරන ලද එක් එක් ජාතික ක්‍රීඩා සංගමයෙන් නියෝජිතයන් දෙදෙනෙක්; එහෙත් ඔම් සඳහා ඒ එක් එක් ජාතික ක්‍රීඩා සංගමය ඊට උචිත අන්තර් ජාතික ඒකාබද්ධ සංගමයට අනුබද්ධ වූ හෝ එහි සාමාජික වූ හෝ සංගමයක් විය යුතු අතර ඒ සංගමය පෙනී සිටින ක්‍රීඩා, ඔලිම්පික් ක්‍රීඩා වැඩ සටහනට ඇතුළත් ක්‍රීඩා විය යුතු ය.

ලියාපදිංචි කරනු ලද වෙනත් ජාතික ක්‍රීඩා සංගම්වල අභිනියෝජිත යන් හෝ ඔලිම්පික් ව්‍යාපාරයට විශිෂ්ට සේවයක් සලසා ඇති හෝ සැලසිය හැකි තැනැත්තන් එම කමිටුව විසින් අමතර ව එක් කර ගත හැකි ය. එසේ වුව ද ඒ අමතර ව එක් කර ගන්නා සාමාජික යන්ගෙන්, කමිටුවේ ඡන්දය හිමි බහුතර සංඛ්‍යාව සංයුක්ත නො විය යුතු ය.

19. ඒ කමිටුවේ ක්‍රියාකාරිත්වය, බලතල සහ යුතුකම් නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු ය.

කමිටුවේ ක්‍රියාකාරිත්වය යනාදිය.

20. කමිටුවේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා ඒ කමිටුව විසින් රීති සෑදිය හැකි ය.

කමිටුවේ රීති.

21. යම් තැනැත්තකු—

නුසුදුසුකම්.

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටිනහොත්; හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටිනහොත්; හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනීමෙහි, කොටස් එක්කර සෑදීමෙහි, විකිණීමෙහි හෝ නිෂ්පාදනය කිරීමෙහි ලා කෙළින් ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් දරනහොත්; හෝ

(ඈ) අමාත්‍යවරයාගේ මතය අනුව චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයක දී වරදකරු කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා ඒ කමිටුවේ සේවය කිරීමට නුසුදුසු විය යුතු ය.

## II වන කොටස

### ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවීම සහ පරිපාලනය කිරීම

ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවීම.

22. ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්යදීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා, මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ හා ජාතික ක්‍රීඩා අරමුදල යනුවෙන් හැඳින්වෙන්නා වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

අරමුදලට කළ යුතු ගෙවීම.

23. (අ) අරමුදලේ කාර්යයන් සඳහා කලින් කල ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) යම් විදේශීය රටකින් ආධාර වශයෙන් ලැබෙන සියලු මුදල් ;

(ඇ) යම් තැනැත්තකු විසින් අරමුදලට කරන ලද පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල් ; සහ

(ඈ) වෙනත් යම් මාර්ගයකින් ලැබෙන මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද යම් නිශ්චිත කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත යුතු වීමේ කොන්දේසිය පිට මේ වගන්තියේ (අ), (ඇ) හෝ (ඈ) ඡේද යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක ඒ මුදල් අරමුදලේ බැරට භාර ගැනීම සම්පූර්ණයෙන් ම අමාත්‍යවරයාගේ අභිමතය අනුව විය යුතු ය :

එසේ ම තවදුරටත්, ප්‍රදාන හෝ පරිත්‍යාග කිරීම පිණිස යොදා ගැනීමට හෝ යම්කිසි නිශ්චිත කාර්යයන් සඳහා භාරයක් වශයෙන් තබා ගැනීමට අමාත්‍යවරයාගේ අභිමතය අනුව මුදල් භාරගනු ලැබිය හැකි අතර ඒ මුදල් අරමුදලට බැර නොකර, වෙනම තබා ගත හැකි ය.

චංචල සහ නිශ්චල දේපළ පරිත්‍යාග.

24. යම් නිශ්චල හෝ චංචල දේපළ පරිත්‍යාගයක් මේ පනතේ කාර්යයන් සඳහා යෙදීම පිණිස ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබිය හැකි ය. එවැනි යම් දේපළක් අමාත්‍යවරයාගේ අභිමතය පරිදි සහ ඔහු විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විකුණා ඒ විකිණීමෙන් ලැබෙන මුදල් අරමුදලට බැර කරනු ලැබිය හැකි ය.

අරමුදලේ පරිපාලනය.

25. (1) අරමුදල අමාත්‍යවරයාගේ පාලනය සහ පරිපාලනය යටතේ තිබිය යුතු අතර එය අමාත්‍යවරයාගේ විධානවලට යටත් ව අමාත්‍යාංශයේ ලේකම් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකි තාක් ඉක්මණින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙළ කළ යුතු ය.

(3) එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් පරිපූර්ණ ලෙස හා උචිත ලෙස අරමුදලේ ගණන් හිලව් තබා ගෙන යාමට අමාත්‍යාංශයේ ලේකම් විසින් සැලැස්විය යුතු ය.

(4) 1971 අංක 38 දරන මුදල් පනතෙහි II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අරමුදලේ මුදල් පාලනය හා ගණන් තිලව් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

26. අමාත්‍යවරයා විසින් හැකි තාක් ඉක්මණින් එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක්, එම අරමුදලේ විගණනය කරන ලද එම වර්ෂයේ ගණන්වල පිටපතක් ද, ඒ ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමග, ජාතික රාජ්‍ය සභාව හමුවේ තැබිය යුතු ය.

අරමුදල පිළිබඳ වාර්තාව.

27. අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්—

(අ) ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්‍ය දීම, එය දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ද;

(ආ) ක්‍රීඩා විෂයෙහි ලබා දී ඇති යම් සම්මානයකට සැලකිලි වශයෙන් ක්‍රීඩාවලට දැනට සහභාගිවන්නන්ට හෝ ඉහත දී සහභාගිවූවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන් ද;

(ඇ) යම් බැංකුවක ස්ථිර තැන්පතු ලෙස හෝ ආණ්ඩුවේ යම් ණය මුදලක හෝ ණයකරවල ආයෝජනය කිරීම සඳහා; සහ

(ඈ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා ද

ඔහු විසින් අරමුදලෙන් ගෙවනු ලැබිය හැකි ය.

අරමුදලින් කරනු ලබන ගෙවීම.

## III වන කොටස

### ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම සහ අනුපාලනය කිරීම

28. ජාතික ක්‍රීඩා සංගමයක් පිහිටුවිය හැකි යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් නම් කිරීම.

29. 28 වන වගන්තිය යටතේ වූ නියමයක් මඟින් යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් නම් කරනු ලැබූ කල්හි—

(අ) ඒ නියමය කරනු ලැබූ අවස්ථාවේ ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පන්තිය පිළිබඳ ව පවත්නා වූ යම් ජාතික සංගමයක්, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත දී මේ පනතෙහි මින් මතු එන විධිවිධානවලට අනුකූල ව, ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කළ යුතු ය; තව ද

(ආ) ඒ නියමය කරනු ලැබූ දිනයෙන් පසු පිහිටුවනු ලබන ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පන්තිය පිළිබඳ යම් ජාතික සංගමයක්, එය පිහිටුවා මාස තුනක් ඇතුළත දී මේ පනතෙහි මින් මතු එන විධිවිධානවලට අනුකූල ව, ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.

ජාතික ක්‍රීඩා සංගම ලියාපදිංචි කිරීම.

**ජාතික ක්‍රීඩා සංගම්වල තීරණවලට සහ ක්‍රියාවලට විරුද්ධ අභියාචනා.**

30. ලියාපදිංචි කළ ජාතික ක්‍රීඩා සංගමයක යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, මේ පනතෙහි හින් මතු එන විධිවිධානවලට අනුකූල ව, ඒ තීරණයට හෝ ක්‍රියාවට විරුද්ධ ව අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකි ය. ඒ අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර එය යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

**ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය හා ඒවායේ සංයුතිය, සංස්ථාපනය, යුතුකම්, බලතල සහ කාර්යයන් ආදිය.**

31. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය :—

(අ) ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය සහ ඒවා ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු ;

(ආ) සංගම්වල සංයුතිය හා සංස්ථාපනය ;

(ඇ) ඒ සංගම්වල යුතුකම්, බලතල සහ කාර්යයන් ;

(ඈ) ඒ සංගම්වල තීරණවලට හෝ ක්‍රියාවලට විරුද්ධ ව අභියාචනා ඉදිරිපත් කිරීමේ කාර්ය පරිපාටිය ; සහ

(ඉ) ඒ සංගම් විසින් පුහුණුකයන්, තීරකයන්, පාපිදලන් තෑන් සහ විනිශ්චයකරුවන් පත් කිරීමේ කාර්ය පරිපාටිය.

**ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම.**

32. (අ) සංගමයේ නිලධාරීන්ගේ හෝ සාමාජිකයන්ගේ දූෂණ, විෂමාචාරය හෝ අක්‍රමිකතා යමක් සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිඛිත නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබූ විට ඒ නිවේදනයේ සඳහන් ව තිබිය හැකි කාලය තුළදී එසේ ප්‍රතිකර්ම යෙදීමට අපොහොසත් වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසලකා හැරීම නිසා ; හෝ

(ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ලා අකර්මණ්‍ය ව සිටීම, සහයෝගය නොදීම හෝ අවහිර කිරීම නිසා ; හෝ

(ඇ) සංගමයේ යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම් පැහැර හැරීම නිසා

ජාතික ක්‍රීඩා සංගමයක් ලියාපදිංචිකිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

මේ වගන්තියෙහි “අමාත්‍යාංශයේ ලේකම්වරයා” යන්නට ක්‍රීඩා අධ්‍යක්ෂවරයා, සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙක් හෝ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙක් ඇතුළත් වේ.

**තාවකාලික කාර්යක්‍රම.**

33. අත්හිටුවනු ලැබූ හෝ ලියාපදිංචිකිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ නැතහොත් අවලංගු කරනු ලැබූ ජාතික ක්‍රීඩා සංගමයක කාර්යයන් කරගෙන යාම සඳහා තාවකාලික කාර්යක්‍රම අමාත්‍යවරයා විසින් ඇති කළ හැකි ය.

ජාතික ක්‍රීඩා සංගම් විසුරුවා හැරීම.

**34.** (1) 29 වන වගන්තිය යටතේ ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් නොකළ හෝ ලියාපදිංචි කිරීම 32 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද හෝ අවලංගු කරන ලද යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසුරුවා හරින ලෙස ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කළ හැකි අතර, ඒ නියමයෙහි සඳහන් කර තිබිය යුතු කාලය තුළදී ඒ සංගමය විසුරුවා හැරීමෙන් හා එහි කටයුතු අවසන් කරලීමෙන් ඒ සංගමයේ නිලධරයන් විසින් ඒ නියමය ක්‍රියාවේ යෙදවිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ විසුරුවා හැරීමේ නියමයක් ක්‍රියාවෙහි නොයොදවන හෝ එසේ ක්‍රියාවෙහි යෙදවීම නොසලකා හරින ජාතික ක්‍රීඩා සංගමයක නිලධරයන් වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරුවන් කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) ජාතික ක්‍රීඩා සංගමයක් විසුරුවා හැරීමේ නියමයක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබ ඇති විට සහ ඒ නියමය ක්‍රියාවෙහි යෙදවීම සඳහා සඳහන් කාලසීමාව ඉකුත් වී ඇති විට, ඉන් පසු එම සංගමයේ සාමාජිකයකු වන හෝ සාමාජිකත්වය තවදුරටත් පවත්වා ගෙන යන යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකට ම සහ එසේ වරදකරු කරනු ලැබූ පසු තවදුරටත් ඔහු ඒ සංගමයේ සාමාජිකයකු ව සිටින එක් එක් දිනය සඳහා රුපියල් පනහකට නොවැඩි අමතර දඩයකට ද යටත් විය යුතු ය.

විසුරුවා හැරීමේ නියමයන් ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය.

**35.** යම් ජාතික ක්‍රීඩා සංගමයක් සම්බන්ධයෙන් 34 (1) වන වගන්තිය යටතේ කරන ලද විසුරුවා හැරීමේ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම අවශ්‍යාවෝචිත බව අමාත්‍යවරයා සලකතහොත් එසේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම ද අලුතින් නිලධරයන් තෝරා ගන්නා ලෙස හා යම් දූෂණ, විෂමාචාර හෝ අක්‍රමිකතා තිබේ නම් ඒවාට ප්‍රතිකර්ම යොදන ලෙස ද අමාත්‍යවරයා විසින් ඒ සංගමයේ සාමාජිකයන්ට නියම කළ හැකි ය. ඉන් පසු තම අභිමතය අනුව අමාත්‍යවරයා විසින් ඒ සංගමය ලියාපදිංචි කිරීමට හෝ නැවත ලියාපදිංචි කිරීමට අවසර දිය හැකි ය.

## IV වන කොටස

## ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම

ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම.

**36.** අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යයන් සඳහා ශිල්පායතනයක් හෝ ශිල්පායතන ගණනක් පිහිටුවනු ලැබිය හැකි ය :—

(අ) ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ දැනුම, උපදෙස් සහ පුහුණුව ලබා දීම

(ආ) එම ශිල්පායතනවල ශිෂ්‍යයන් විසින් ලබා ඇති ප්‍රවීණතාව නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම ; සහ

(ඇ) එම ශිල්පායතන විසින් පවත්වනු ලබන විභාගවලින් සමත් වූ අයට උපාධි හා අභිඥාන පත්‍ර පිරිනැමීම සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම.

ක්‍රීඩා ශිල්පායතනවලට ඇතුළත් කිරීමේ පරිපාටි සහ ඒවායේ අධ්‍යයන පරිපාටි.

37. අමාත්‍යවරයා විසින් නියෝග මගින්—

(අ) ශිල්පායතනවලට ඇතුළත් කර ගැනීමේ පරිපාටි ;

(ආ) ඒ ශිල්පායතනවල අධ්‍යාපනය, පුහුණුව සහ විභාග පිළිබඳ පරිපාටි ; සහ

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි ඒ ශිල්පායතනවලට අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, ගුරුවරුන්, උපදේශකයන් සහ වෙනත් නිලධරයන් පත් කිරීම සහ ඔවුන්ට වැටුප් ගෙවීම පිළිබඳ පරිපාටි

නියම කරනු ලැබිය හැකි ය.

ක්‍රීඩා ශිල්පායතනවල පහසුකම් සැපයීම, විනය පාලනය ආදිය සඳහා අමාත්‍යවරයා සතු බලය.

38. අමාත්‍යවරයාට —

(අ) ඒ ශිල්පායතනවලට පහසුකම් සැපයීම සහ පුහුණුව, නේවාසික පහසුකම් හා ඒ ශිල්පායතනවල වෙනත් කාර්යයන් සඳහා ගොඩනැගිලි ඉදි කිරීම, ඒවා නඩත්තු කිරීම සහ උපකරණ සජ්ජිත කිරීම සඳහා ද ;

(ආ) ඒ ශිල්පායතනවල ශිෂ්‍යයන්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ විනය සහ ශුභ සාධනය ඇති කිරීම හා විධිමත් කිරීම සඳහා ද ;

(ඇ) ඒ ශිල්පායතන මගින් උපාධි, අභිඥාන පත්‍ර සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ; සහ

(ඈ) ඒ ශිල්පායතනවලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීමේ විධිවිධාන සැලැස්වීම සඳහා ද

බලය තිබිය යුතු ය.

## V වන කොටස

### පොදු විධිවිධාන

අමාත්‍යවරයා සතු බලතල.

39. (1) මේ පනත යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් මණ්ඩලවල බලතල ක්‍රියාවෙහි යෙදවීම, කාර්යයන් කිරීම සහ යුතුකම් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඒ සභා, කමිටු, සංගම් හෝ මණ්ඩල වෙත පොදු හෝ විශේෂ ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර ඒ සභා, කමිටු, සංගම් හෝ වෙනත් මණ්ඩල විසින් ඒ විධාන ක්‍රියාවෙහි යෙදවිය යුතු ය.

(2) එම පනත යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් මණ්ඩලවල දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් වූ වාර වාර්තා, ගණන් සහ වෙනත් තොරතුරු තමාට අවශ්‍ය විය හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඒ සභාවලට, කමිටුවලට, සංගම්වලට සහ වෙනත් මණ්ඩලවලට කලින් කල විධාන කළ හැකි අතර, ඒ සභා, කමිටු, සංගම් සහ වෙනත් මණ්ඩල ඒ සෑම විධානයක් ම අනුව ක්‍රියා කළ යුතු ය.

(3) මේ පනත යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් මණ්ඩලවල කටයුතු සියල්ලම හෝ ඉන් යමක් නාමත් විසින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කර වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල නියම කළ හැකි අතර එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයක් ම ක්‍රියාවෙහි යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් සැලැස්වීම සහ සියලු තොරතුරු සැපයීම ඒ සභා, කමිටු, සංගම් සහ වෙනත් මණ්ඩල විසින් කළ යුතු ය.

**ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩාවලට සහභාගිවන්නන් පාලනය කිරීමට අමාත්‍යවරයා සතු බලය.**

**40.** ශ්‍රී ලංකාව නියෝජනය කරති යි සැලකෙන තනි තනි ක්‍රීඩකයන් හෝ ක්‍රීඩක කණ්ඩායම් ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී හෝ ක්‍රීඩාවලට සහභාගිවීම නියෝග මගින් විධිමත් කිරීම ද පාලනය කිරීම ද අමාත්‍යවරයා විසින් කළ හැකි ය.

**නියෝග සෑදීමේ බලය.**

**41.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහාත් නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් නියමිත සියලු කරුණු සඳහාත් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කර තිබිය හැකි පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

එසේ අනුමත කරනු නො ලැබූ යම් නියෝගයක් එය අනනුමත වූ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතු ය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතු ය.

**පාරිශ්‍රමික.**

**42.** මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ක්‍රීඩා සභාවේ සහ දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල සාමාජිකයන්ට මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ ප්‍රමාණයන් අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි —

"අමාත්‍යවරයා" යන්නෙන් අග්‍රාමාත්‍යවරයා විසින් ක්‍රීඩා විෂය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා අදහස් වන අතර "අමාත්‍යාංශය" යන්න ඒ අනුව තේරුම් ගත යුතු ය;

"ක්‍රීඩාව" හෝ "ක්‍රීඩා" යන්නට අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ පනතේ කාර්යයන් සඳහා ක්‍රීඩා වශයෙන් පිළිගනු ලැබූ යම් ආකාරයක ක්‍රීඩා, විනෝද ක්‍රියා, ශාරීරිකාභ්‍යාස, කාය වර්ධන ව්‍යායාම සහ වෙනත් ව්‍යායාම ඇතුළත් වේ;

"ජාතික ක්‍රීඩා සංගමයක්" යන්නෙන් 28 වන වගන්තිය යටතේ නම් කරන ලද ක්‍රීඩාවක් නැතහොත් ක්‍රීඩා පන්තියක් පාලනය කරන සංගමයක්, ඒකාබද්ධ සංගමයක් හෝ මණ්ඩලයක් අදහස් වේ.